**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව - 2023**
---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.305,010ක් වූ සංවර්ධන ව්‍යාපෘති 02ක් හා ශබ්ද පරිපාලන පද්ධතිය ප්‍රාග්ධනිත කර නොතිබුණි. එමෙන්ම, රු.86,422ක උපචිත වියදම් ද ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | වැරදි හර හා බැර නිසා 2023 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ශේෂය රු.54,278,046ක් වැඩියෙන් දැක්වුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | ගිණුම් විෂයයන් 03කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එම ශේෂ අතර රු.1,943,164ක වෙනසක් විය. | වෙනස්කම් හඳුනාගනිමින් තුලනය කිරීමට කටයුතු කරමින් පවතී. | වෙනස්කම් නිරවුල් කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.96,818,228ක් වූ ගිණුම් විෂයයන් 03ක විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | ඉදිරියේදී ඉදිරිපත් කරමි. | උපලේඛන පිළියෙල කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) අනුව, 2002 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලබා දී තිබුණු රු.4,630,332ක අත්තිකාරම් 111ක් පියවා නොතිබුණි. | තොරතුරු නොමැති අත්තිකාරම් කපාහැරීමට සහ අනෙක් අත්තිකාරම් අයකිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,680,873 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,147,407ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,958,337 | 1,047,965 | 1,126,452 | 97,516 | 2,908,337 | 859,515 | 863,702 | 160,622 |
| කුලී | 5,115,480 | 4,537,460 | 4,544,640 | 638,375 | 4,375,480 | 3,211,450 | 2,744,860 | 493,180 |
| බලපත්‍ර ගාස්තු | 1,851,000 | 1,112,976 | 1,097,776 | 15,200 | 1,831,000 | 588,026 | 588,026 | - |
| වෙනත් ආදායම් | 8,200,000 | 8,644,414 | 10,239,619 | 7,168,690 | 12,706,800 | 10,008,078 | 52,318,480 | 8,721,859 |
| | 18,124,817 | 15,342,815 | 17,008,487 | 7,919,781 | 21,821,617 | 14,667,069 | 56,515,068 | 9,375,661 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 03කට වඩා පැරණි හිඟහිටි රු.72,358ක අක්කර බදු ශේෂයක් පැවැතිණි. | අයකළ නොහැකි බදු කපා හැරීමට කටයුතු කරමි. | ආදායම් නොපමාව අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පාරිභෝගිකයින් 2209 දෙනෙකුට ලබා දෙන ජලය බීමට සුදුසු ද යන්න පරීක්ෂා කර නොතිබුණි. යොදා තිබුණු ජල මීටර් 145ක් අක්‍රීයව පැවැති අතර 2024 මාර්තු 31 දිනට රු.5,316,619ක හිඟ ජල ගාස්තු අය වීමට පැවැතිණි. | පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කර ඇත. අක්‍රිය මීටර් අලුත්වැඩියා කරමින් පවතී. හිඟ අයකර ගැනීමට ජංගම වැඩසටහන් පැවැත්වීම හා ජල සම්බන්ධතා විසන්ධි කිරීමට කටයුතු කෙරේ. | අදාළ පරීක්ෂණ සිදුකළ යුතු අතර හිඟ ගාස්තු අයකරගත යුතු වේ. |
| (ඇ) | සංවර්ධිත ප්‍රදේශ ලෙස 2018 වර්ෂයේදී හඳුනාගත් කලාපවල පදිංචි පවුල් ඒකක 783කින් වරිපනම් බදු අයකර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | ආදායම් නොපමාව අය කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පඹහින්න සතිපොළ සංවර්ධනය සඳහා 2017 වර්ෂය වන විට රු.4,561,397ක් වැයකර තිබුණ ද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධනය නොකිරීම නිසා වැයකළ මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි. | ප්‍රතිපාදන නොලැබීම නිසා ඉතිරි සංවර්ධන කටයුතු මේ දක්වා කළ නොහැකි විය. | වැය කළ මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබිය යුතු වේ. |

### 3.2 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර පාසල් 02ක ළමුන්ගෙන් 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් අයකළ රු.800,000ක ගාස්තු සභා අරමුදලට බැරකර නොතිබුණි. එසේ වුවත්, එම පෙර පාසැල්වල පාලිකාවන් වෙත රු.12,000 බැගින් මාසික දීමනා ගෙවා තිබුණු අතර, සියලු නඩත්තු කටයුතු ද සභාව මඟින් ඉටුකර තිබුණි. | සභාව සතුව ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් එහි අනෙකුත් නඩත්තු කටයුතු සිදුකරන්නේ පෙර පාසල මඟිනි. ඒ සඳහා මුදල් අයකර ඇති අතර, එය මාසිකව සිදුකළ අයකිරීමක් නොවේ. | සාවද්‍ය පිළිතුරකි. රු.1,000 බැගින් මාසික ගාස්තු අය කෙරේ. දරුවන්ගෙන් අයකරන ගාස්තු සභා අරමුදලට බැර කළ යුතු වේ. |
| (ආ) | සම්ප්‍රේෂණ කුළුණු 05ක් සඳහා වර්ෂ 2021-2023 කාලය තුළ ලබාදුන් තාවකාලික අනුමැතිය ස්ථිර කිරීමට මේ දක්වාමත් කටයුතු කර නොතිබුණු අතර පෙරසැරි ගාස්තු රු.376,000ක් අඩුවෙන් අයකර තිබුණි. | ලිපි මඟින් එම ආයතන දැනුවත් කර ඇත. | අනුමැතීන් විධිමත් කිරීමට හා හිඟහිටි පෙරසැරි ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ලබාදුන් රු.50,000ක ප්‍රතිපාදන වැරදි ලෙස වැය කිරීම නිසා එම මුදල් | මේ සම්බන්ධයෙන් මු.රෙ 104 පරීක්ෂණයක් කරන ලෙස පළාත් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු |

| | | |
|---|---|---|
| පළාත් සභාව විසින් පියවා නොතිබුණි. | පාලන කොමසාරිස්ගෙන් ඉල්ලා ඇත. | කළ යුතු වේ. |

**3.3 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 42ක් වැයකර ඉදිකළ 2016 වර්ෂයේදී සභාවට පවරා දුන් ගලගම බහුකාර්යය ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. | මෙම ගොඩනැගිල්ල ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස යොදවා ගැනීමට සාකච්ඡා කරමින් පවතී. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්මික නිලධාරී වාර්තා මත පදනම්ව 2014 වර්ෂයේදී ක්‍රීඩාපිටියක සංවර්ධනයක් වෙනුවෙන් රු.176,400ක් ගෙවා තිබුණ ද, එම සංවර්ධනය කටයුතු අසම්පූර්ණ නිසා ගෙවූ මුදල ප්‍රතිපූරණය කළ නොහැකි බවත්, එම මුදල රාජ්‍ය ආදායමට බැර කළ බවත් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් විසින් 2023 මැයි මාසයේදී දන්වා තිබුණි. | මේ සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස රත්නපුර දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. | පරීක්ෂණයක් සිදුකර වගකීම නිශ්චය කළ යුතු වේ. |
| (ආ) | සබරගමුව පළාත් සභා ප්‍රතිපාදන මත සිදුකළ කර්මාන්තයක් සඳහා රු.268,650ක් සභා අරමුදලින් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | මේ සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස රත්නපුර දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. | පරීක්ෂණයක් සිදුකර වගකීම නිශ්චය කළ යුතු වේ. |

**3.5 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලුත්වැඩියාවක් සඳහා 2021 වර්ෂයේදී භාරදුන් ට්‍රැක්ටරයක් 2023 නොවැම්බර් වන විටත් කිසිඳු අලුත්වැඩියාවකින් තොරව එම ගරාජය තුළ පැවැතිණි. | එම ට්‍රැක්ටරය අලුත්වැඩියා කර නැත. ඇඹිලිපිටිය නගර සභාවට ලබාදීමට කටයුතු සූදානම් කර ඇත. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |